ඇතැම් රටවල තවමත් දිවිතොර කරගැනීම අපරාධයක් ලෙසින් සැලකෙන නමුත්, වර්තමානය වන විට පොදුවේ එය සමාජ ගැටළුවක් ලෙසින් විනා නීතිය ඉදිරියේ වන අපරාධයක් ලෙසින් නොසැලකෙයි. මන්දයත්, දිවිතොර කරගැනීම අපරාධයක් ලෙසින් ගැනීම ඔස්සේ දිවි තොරකරගැනීම කෙරෙහි වන සමාජ ගර්හාවට අනවශ්‍ය ලෙසින් ඉන්ධන සැපයීමක් සිදුවන බැවිනි. එනිසා දිවි තොරකරගැනීමක් පිළිබඳ වාර්තා කිරීමේදී 'commits suicide' යනුවෙන් සඳහන් නොකළ යුතු බව මේ සම්බන්ධ නිර්දේශයන් තුළ දැක්වේ. ඒ වෙනුවට “died by suicide” හෝ “took his/her life” වැනි සඳහනක් වඩාත් උචිත වනු ඇත. ඒ අනුව ගත් විට, Ceylon Today මෙහිදී ආචාර ධාර්මික අයුරින් Take own life ලෙස සඳහන් කර තිබීම ප්‍රශංසා කටයුතු වේ.

මීට අමතරව දිවි තොරකරගැනීම් වාර්තා කිරීමේදී ඒ සමගින් හදිසි උපකාරක අංකද සඳහන් කිරීම ඔස්සේ, දිවි තොරකරගැනීමට නැඹුරුතාවක් ඇති අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට ඇති ඉඩ විශාල වශයෙන් වැඩි වනු ඇත.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:


https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=D14833A4878E3B3D96D0721858FB5F4E?sequence=1&fbclid=IwAR1fdTnS9Q7ypAPo7yA5c9CLHDTZ4kgObuTAYFazm1OGnq4GZAgdgepYMUY
https://media.samaritans.org/documents/Media_Guidelines_FINAL_v2_TABa8C6.pdf?fbclid=IwAR3fIn4tQgPYB4pAabCMh01VJmfxpsMX-b-U0hjCTLMUCa_FeJbhYjMomL4

#MediaEthicsSL #lka #EnglishPress #DailyMirror #CeylonToday